**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ගිණුම්කරණ මූලධර්මවලට අනුව පරිත්‍යාග ලෙස ලැබෙන ඉඩම් මූල්‍ය ප්‍රකාශනවලින් හඳුනා ගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් සකස් කරගෙන නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූරු.75,618 ක කාර්යාල උපකරණවල වටිනාකම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලට ගෙන තිබූ රු.835,068 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී පරිත්‍යාග ලෙස රාජ්‍ය ආයතනයකට ලබාදී තිබුණු රු.150,000 ක් වටිනා ධූමායන යන්ත්‍රය ස්ථාවර වත්කම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ නිවාස දේපල සංවර්ධනය කර අලෙවි කිරීම් කටයුතුවලින් ලැබුණු අක්කර 01 රූඩ් 03 පර්චස් 34.58 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.3 නොසැසඳුණු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 05 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා ඊට අනුරූපී උපයෝගී ලේඛනවල ශේෂයන් අතර එකතුව රු.2,285,913 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

### 1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

(අ) ලැබියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.178,665,866 ක් වූ ලැබියයුතු ගිණුම් ශේෂවලින් රු.74,853,575 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.43,999,446 ක් වූ අතර, එයින් රු.12,657,766 ක් වසර එකකට වැඩි කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.169,735 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1987අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>154 (1) | 6,244,921 | වෙන්දේසි ඉඩම් 30 ක් සඳහා ඇස්තමේන්තු විකුණුම් මිලෙන් සියයට එකක් අයකරගෙන තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| i. 207 රීතිය | 10,626,541 | 2017 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා අවස්ථා 66 කදී පොදු තරඟකාරීත්වයකින් තොරව ගබඩා ද්‍රව්‍ය මිලදී ගැනීම් සිදුකර තිබුණි. |
| ii. 194 හා 212 රීති | 5,798,350 | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඉන්වෙන්ට්‍රි පොත්වල හා ගබඩා ද්‍රව්‍ය තොග පොත්වල සටහන් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| iii. | 218 රීතිය | 204,072,234 | සභාවේ සියළු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක්වත් පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.70,720,262ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.63,234,039 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම්, රැස්කළ ආදායම් හා හිඟහිටි ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2017 ඇස්තමේන්තුගත ආදායම් | 2017 බිල්කළ ආදායම් | 2017 රැස්කළ ආදායම් | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම් | 2016 බිල්කළ ආදායම් | 2016 රැස්කළ ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| I. | වරිපනම් හා බදු | 1,711 | 2,111 | 1,931 | 658 | 1,331 | 1,868 | 1,949 | 479 |
| II. | බදු කුලී | 8,203 | 9,795 | 1,757 | 58 | 8,634 | 8,634 | 8,659 | 65 |
| III. | බලපත්‍ර ගාස්තු | 514 | 642 | 642 | - | 549 | 549 | 554 | - |
| IV. | වෙනත් ආදායම් | 138,826 | 156,227 | 149,192 | 156,993 | 78,429 | 109,429 | 114,814 | 149,958 |
| එකතුව | | 149,254 | 168,775 | 153,522 | 157,709 | 88,943 | 120,480 | 125,976 | 150,502 |

සටහන

සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම තුළ ඉකුත් වර්ෂයේ හිඟව පැවති රු.80,829,000 ක් ඇතුළත්ව තිබුණි.

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

---

සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රුපියල් මිලියන 150 ක් වූ හිඟයෙන් හා රුපියල් මිලියන 168 ක් වූ වර්ෂයේ බිල් කිරීම්වලින් රුපියල් මිලියන 153ක් හෙවත් සියයට 48 ක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් රුපියල් මිලියන 157 ක් අයකර ගැනීමට තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

---

වර්ෂය තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.273,573 ක් වූ වරිපනම්, රු.318,445 ක් වූ අක්කර බදු සහ රු.66,000 ක ව්‍යාපාර බදු සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වශයෙන් ගිණුම්වල පෙන්වා තිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---

පළාත් ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.27,160,126 ක් හා මුද්දර ගාස්තු රු.119,383,608 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1 කාර්යසාධනය**

---

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 14 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

i. මාසිකව සභා බල ප්‍රදේශය තුළ එකතුවන කසළ ටොන් 50න් දිරන කසළ ටොන් 36 ක් පමණ කොම්පෝස්ට් පොහොර සෑදීමට භාවිතා කරන අතර, ඉතිරිය තුළ වූ වීදුරු කටු පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂය තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා පුනරාවර්තන වියදම් ලෙස රු.161,800,516 ක් ද, ඝණ අපද්‍රව්‍ය අංගනයේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රාග්ධන වැය ලෙස රු. 1,870,180 ක් ද, 2016 වර්ෂය තුළ ජීව වායු ඒකකය සඳහා රු.1,000,000 ක් ද වැයකර තිබුණි.

(ඇ) පාරිසරික ගැටළු

--------------------

පොල් වගාකර තිබුණු ඉඩම් අක්කර 62 කට වැඩි ප්‍රමාණයක් නිවාස දේපල සඳහා සංවර්ධනය කර විකිණීමට සමාලෝචිත වර්ෂය තුළ අනුමත කර තිබුණද එමගින් බල ප්‍රදේශය තුල පාරිසරිකව සිදුවූ බලපෑම අධ්‍යනය කර එහි අහිතකර බලපෑම් අවම කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

-------------------------------

සමාලෝචිත වර්ෂය තුළ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා

--------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 144 හා 157 ක් වූ අතර, තාක්ෂණික නිලධාරී (සිවිල්) විශේෂ ශ්‍රේණියේ තනතුරක්, පුස්තකාලාධිපති තනතුරු 06 ක්, පෙර පාසැල් පාලිකා තනතුරු 03 ක්, ආදායම් පරිපාලක තනතුරු 03 ක් වශයෙන් පුරප්පාඩු 13 ක් පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලය තුළට ඇතුළත් නොවූ සංවර්ධන නිලධාරීන් 23 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කර තිබුණි. තවද, ප්‍රාථමික තනතුරුවලට අදාළව සේවකයින් තිදෙනෙකු අතිරික්තව සේවයේ යොදවා තිබුණි.

(ආ) සේවක ණය

---------------

සභාවේ සේවය අතහැර ගොස් තිබූ සේවකයෙකුගෙන් රු.124,624 ක ආපදා ණය මුදලක් අයකරගත යුතුව තිබුණි.

**3.3 ආර්ථික නොවූ ගණුදෙනු**

**---------------------------**

මාර්ග ඉදි කිරීම් හා නඩත්තුව සඳහා යොදා ගැනීමට සභාව සතුව මාර්ග තලනයක්, මෝටර් ග්‍රේඩරය සහ බැකෝ ලෝඩරයක් තිබියදීත්, සමාලෝචිත වර්ෂය තුළ එම කටයුතු සඳහා පිටතින් ලබාගත් වාහන වෙනුවෙන් බාහිර ආයතනවලට රු.4,816,901 ක් ගෙවා තිබුණි.

## 3.4 ප්‍රසම්පාදනය

------------------

### 3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සභාව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 4.2.1 විධිවිධානයන්ට අනුකූලව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. එමෙන්ම ඊළඟ වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කර නොතිබීම සහ ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කර නොතිබුණි.

### 3.4.2 සැපයීම් හා සේවා

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් 2017 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා අවස්ථා 66 කදී රු.10,626,541 ක මිලදී ගැනීම් තරඟකාරී බවකින් තොරව මිලදීගෙන තිබූ අතර, එම ආයතනවලින් ඇණවුම් කළ රු.858,001 ක් වූ භාණ්ඩ දින 07 සිට දින 30 ක් ඉක්මවා ප්‍රමාද වී ලද අවස්ථා 05 ක් විය.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ලංසු කැඳවීමේ විස්තර ඇතුළත් ලේඛන තැපැලෙන් හෝ පෞද්ගලිකව ලංසුකරුවෙකුට ලබා ගැනීමට සැලැස්විය යුතු වුවද, රු.1,580,515 ක් වූ මිලදී ගැනීම් අවස්ථා 19 කට අදාළව විස්තර ඇතුළත් ලේඛන ලංසුකරුවන් වෙත ලබාදීමට සලස්වා නොතිබුණි.

(ඇ) කළුගල් ආශ්‍රිත ද්‍රව්‍ය සැපයීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි වී තිබුණත්, 2013 වර්ෂයේදී මිල ගණන් කැඳවීමකින් තෝරාගත් ආයතනයකින් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 67 කදී රු.14,966,268 ක් වූ කළුගල් ආශ්‍රිත නිෂ්පාදන මිලදී ගැනීම් සිදුකර තිබුණි. එම තත්ත්වය 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලා 207 ට පටහැනිව කටයුතු කිරීමකි.

(ඈ) 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව අදාල සමිතිවල මූල්‍ය තත්ත්ව පිළිබඳ සනාථ කර ගැනීමකින් තොරව සමිති 09 කට එකතුව රු.5,401,165 ක් වූ කොන්ත්‍රාත් 09 ක් පිරිනමා තිබුණි.

(ඉ) රු.3,612,000 ක් වැයකර පරිගණක 40 ක් මිලදී ගැනීමට අදාළ පිරිවිතර පුවත්පත් දැන්වීමේ දක්වා නොතිබූ අතර, අදාළ ගෙවීම් සිදු කිරීමට පෙර එම පරිගණක නියමිත පිරිවිතර අනුව පවතීද යන්න තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් පරීක්ෂා කර සහතික කර නොතිබුණි. මිල කැඳවීම් විස්තර අනුව පරිගණක පද්ධතිය වින්ඩෝස් 10 වියයුතු වුවද, වින්ඩෝස් 8.1 පරිගණකයක් මිලට ගෙන තිබුණි.

### 3.4.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නක්කාවත්ත අගුරුකන්ද මාර්ගයට කුට්ටිගල් ඇල්ලීමේ ව්‍යාපෘතියේ දෙපස කර්බ්වල උස අඩුවෙන් යෙදීම නිසා රු.39,735 ක් වැඩියෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ආ) නක්කාවත්ත අගුරුකන්ද ආගර මාවතට කුට්ටි ගල් ඇල්ලීමේදී දෙපස කර්බ් නියමිත උසට යොදා නොතිබුණ බැවින් කොන්ත්‍රාත්කරුට රු.39,945 ක් වැඩිපුර ගෙවා තිබුණි. කුට්ටිගල් ඇතිරීම සඳහා කළුගල් කුඩු යොදා සමාන්තරව තලා නොතිබුණ බැවින් කුට්ටි ගල් එක මට්ටමක යොදා නොතිබුණි.

(ඇ) මුරුතැන්නේ ජයමාවත ඉඩම දක්වා රු.977,183 කින් තාර දමා සංවර්ධනය කර තිබුණු මාර්ගයේ එක් ස්ථානයක මීටර් 16.5x.6 ක පමණ ප්‍රමාණයක් ගිලා බැස තිබුණි. එමෙන්ම දිවුල්ගස් හන්දියේ සිට නාවල්ල ගෙදර දක්වා මාර්ගයේ ඉතිරි කොටස තාර ඇමීම සඳහා රු.686,392 ගෙවා තිබූ නමුත් අදාළ මාර්ගයේ මි.මී 600x600 ක් ගිලා බැස තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

පුනරාවර්ථන වියදම් සඳහා රුපියල් මිලියන 124 ක ප්‍රතිපාදන සලසා තිබුණද සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක නොවීම මත පුනරාවර්ථන වියදම් රුපියල් මිලියන 25 ක ඉතිරිවීම් තිබීම හා රු.38,668,000 ක් වූ අයවැයගත ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉක්මවා රු.96,757,439 ක ප්‍රාග්ධන වැය දරා තිබීම මත අයවැය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන කටයුතු සඳහා පත්කර තිබුණු නිලධාරීන් තිදෙනෙකුට සාමාන්‍ය රාජකාරි කටයුතුද පවරා තිබූ අතර, මුදල් රෙගුලාසි සංග්‍රහයේ 134.3 හි විධි විධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**-------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| ----------- | ------------- |
| (අ) ගිණුම්කරණය | i. මිලදීගත් වත්කම් ගිණුම්ගත නොකිරීම. |
| | ii. උපයෝගී ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| (ආ) ආදායම් | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) සේවක කළමනාකරණය | දීර්ඝ කාලීනව අය නොවන සේවක ණය පැවතීම. |
| (ඇ) කොන්ත්‍රාත් | i. ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම. |
| | ii. නියමිත පිරිවිරතයන්ට අනුකූල නොවන ලෙස ඉදිකිරීම් සිදු කිරීම. |